# ''ඉන්දියාවේ මාඕවාදී නැගී සිටීමට තීරණයක් ලෙස ශ්‍රී ලංකා විසඳුම''
# උපැටුම අරුන්දතී රෝයි ගෙනි.

2009 නොවැම්බර් 16 ''A World to Win'' (දිනා ගැනුමට ලොවක් ඇත) ප්‍රවෘත්ති සේවය.

ඉන්දීය ආණ්ඩුව සූදානම්වන්නේ ''Operation Green Hunt'' (හරිත දඩයම් මෙහෙයුම) නමින් පෙර නොවූ විරූ මහා පරිමාණයෙන් විප්ලව විරෝධී මෙහෙයුමකටයි. ඉන්දීය කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) නායකත්වය දෙන ආදි වාසීන්ගේ කැරැල්ල පොඩි පට්ටම් කර දැමීමට ලක්ෂ ගණනකින් සැදුම් ලත් සොල්දාදුවන් හා ආරක්ෂක හමුදා හට පිරිස් නැගෙනහිර හා මධ්‍යම ඉන්දීය වන ගත කඳු වෙත යැවිය යුතුය. මෙය කෙටි කාලීන ප්‍රහාරයක් (incursion) නොවේ; බලධාරීන් ප්‍රකාශ කර ඇත්තේ ඉදිරි වර්ෂ වලදී ගෝත්‍රික ආදි වාසීන්ගේ ප්‍රදේශවල අති විශාල හමුදාවක් ස්ථානගත කිරීමට ඔවුන් සැලසුම් කරන බවයි.

කාලීන සිදුවීම් විචාරකයින් කීප දෙනෙක්ම අනතුරු අඟවා ඇත්තේ ඉන්දීය රජය ''ශ්‍රී ලංකාවේ විසඳුම'' එනම් පසුගිය වකවානුවේ රාජ්‍ය විසින් මෙහෙයවූ දිග්ගැස්සුණු ආක්‍රමණශීලී ප්‍රහාරය වැනි ආක්‍රමණයක් යෙදීමට සැලසුම් කරන බවයි. දැවැන්ත පාබල හමුදාවක් හා ගුවන් හමුදාවක් යොදා දෙමළ කොටි හමුදාව පරාජය කර, සිවිල් ජනයා රැඳවුම් කඳවුරුවල තවමත් ගාල්කර ඇත. දැවැන්ත ස්ථිර හමුදා කඳවුරු, දෙමළ ජනයාගේ කේන්ද්‍රීය සශ්‍රීක භූමිවල ඉදිවෙමින් පවතී. නිසැකවම ඉන්දියාව හොඳින් දැනගෙන හිටියා ඇමෙරිකා එක්සත් ජනපදය ඒ මෙහෙයුම ව්‍යංගයෙන් අනුමත කළ බව. සමූලඝාතනය අවසන් වූ වහාම, එක්සත් ජනපදයේ නියමයෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ලංකාවට දැවැන්ත මුදලක් බාර දුන්නේය.

ඉන්දීය ලේඛිකා අරුන්දතී රෝයිගේ ලිපියක් 2009 අගෝස්තු 31 වැනිදා ශ්‍රී ලංකා ගාඩියන් (srilankaguardian.org) වෙබ් අඩවියේ සඳහන්ව තිබුණා. ඇගේ දැකීම හා මතවාද නියෝජනය වන අන්දමටත්, ඇගේ පූර්ණ සංවාදය එහි ගැබ්වී තිබුණා. මෙම පිළිකුල් සහගත ප්‍රහාරය පිළිබඳව එක් ලිපියකුත්, ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී) විසින් මෑතදී කළ ප්‍රකාශන දෙකකුත් People's March (peoplesmarch.googlepages.com හෝ bannedthought.net) නොවැම්බර් කලාපයේ පළවුනා. විප්ලවවාදී ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණ විසින් (RDF) කළ ප්‍රකාශනයක් ද 2009 නොවැම්බර් 16 AWTWNS (දිනා ගැනුමට ලොවක් ඇත) පරිඝණක ජාලයේ අන්තර්ගත කර තිබේ.

රටක් ලෙස ඉන්දියාව හෝ ප්‍රාන්තයක් ලෙස ඔරිස්සාව යැයි සඳහන් කිරීමට බොහෝ කලකට පෙර, දකුණ ඔරිස්සාවේ පහත් තැනිතලා කඳු මුදුන් ඩොන්ග්රියා කොන්ද් (Dongria Kondh), (මෙම පළාතේ විසූ ගෝත්‍රික කණ්ඩායමක්) වරුන්ගේ නිජබිම්ව තිබුණා. මෙම කඳු විසින් කොන්ද් වරුන්ව රැක බලා ගැනුණු අතර කොන්ද් වරුන් විසින් මෙම කඳු යාය රැක බලා ගන්නා ලදි; එපමණක් නොව ඒවා දෙවි දේවතාවුන් ලෙස වන්දනා මාන කරන ලදි. ඔවුහු සඳහන් කරන්නේ අද මෙම කඳු යාය ඇලුමිනියම් වලට ප්‍රධාන ලෝපස-බොක්සයිට් සඳහා විකුණා දමා ඇති බවයි.

කොන්ද් වරු සිය නියාම්ගිරි කන්ද, විශ්ව නීතියට අධිපති දෙවි, නියාම් රාජා වැඩ වසන නිවහන ලෙස අදහා ගරු බුහුමන් දක්වති; ඒත් එම කන්ද වේදාන්ත (Vedanta) වැනි නමක් ඇති සමාගමකට විකුණා දමා ඇත. (වේදාන්ත යනු ප්‍රඥ්ඥාවේ අත්‍යන්ත ස්වභාවය උගන්වන හිංදු දර්ශනවාදයේ අංශයකි.) ඉරානයේ ෂා රජු කලක් විසූ එංගලන්තයේ මන්දිරය මිලට ගත් ඉන්දීය බිලියනපති වන එමෙන්ම ලෝකයේ විශාලතම පතල් නිධි කර්මාන්තකරු වන අනිල් අග්ගාවාල් (Anil Aggarwal) මෙම කන්ද තමන් සන්තක කර ගෙන තිබේ. වේදාන්ත යනු ඔරිස්සාව ආසන්නයේ පිහිටි බොහෝ බහු ජාතික සමාගම්වලින් එකක් පමණි.

මෙම කඳු මුදුන් විනාශ කළ හොත්, එහි වන, ආවරණයද අහෝසි වන්නේය. එපමණක්ද නොව මෙම කඳු මතින් නැගී ගලා එන, මිටියාවත් පහළ ගොවීන් පෝෂණය කරන ඇළ දොළ ගංගා සිඳී යන්නේය. ඉක්බිතිව දස දහස් ගණනින් වැඩ වසන ජන කණ්ඩායම් මෙම කඳු වනාන්තර සිය නිජ බිම ලෙස වාස භූමිය ලෙස පැවතියද, ප්‍රහාරයන්ට ලක් වන්නේය.

මධ්‍යම ඉන්දීය වනාන්තර සිය මූල කඳවුරු කරගෙන සිටින මාඕවාදී කැරලිකරුවන්ට එරෙහිව ඉන්දීය ආණ්ඩුව ''හරිත දඩයම් මෙහෙයුම'' (Operation Green Hunt) යන යුද්ධය අපේක්ෂිත අර්ථයෙන්ම ප්‍රකාශයට පත් කර ඇත. ඇත්ත වශයෙන්, මාඕවාදීන් අන් කළ හැකි යමක් නොවීමෙන් කැරලි ගැසීමට අවතීර්ණ වී සිටී. රට පුරාම අරගලයන්ගේ සමස්ථ ප්‍රේක්ෂාවලියකි(Spectrum); ඉඩම් අහිමි දිළින්දන් - දාලිත්වරුන් (ඊනියා කුලහීනයන්), නිවාස නැති පීඩිතයින්, කම්කරුවන්, දිළිඳු ගොවීන්, වියන්නන් (Weavers) - රටේ ජනතාව කැරලි ගැසීම්වල නිරත වෙති. ජනතාවගේ ඉඩම් හා සම්පත් තොග ගණනින් ඒකාබද්ධව ගැනීමට ඉඩ හසර ලබා දෙන ප්‍රතිපත්ති ඇතුළත්, අසාධාරණ විනිශ්චයන්ට එරෙහිව ඔවුහු කරට කර සටන් කරනු ලබති. නමුත් රජය විශාලතම අනතුර ලෙස තෝරාගන්නේ මාඕවාදීන්ය.

වසර දෙකකට ප්‍රථම, අද මෙන් අයහපත් වූ වාතාවරණයක් නොපැවති කල්හි පවා, රටේ ''අභ්‍යන්තර ආරක්ෂාවට'' තර්ජනයක් (internal Security threat) වන කේවල විශාලතම කණ්ඩායම ලෙස මාඕවාදීන්ව, අගමැතිවරයා විසින් ප්‍රකාශ කරන ලදි. ''ස්වාභාවික ඛණිජ සම්පත් බහුලව පවතින ප්‍රදේශවල වාමාංශික අන්තවාදීන් සාර්ථකව වර්ධනය වන්නේ නම්, ආයෝජන අවස්ථා ඇත්ත වශයෙන්ම දුර්මුඛ වනු ඇත.'' යනුවෙන් අගමැතිවරයා පාර්ලිමේන්තුවට සඳහන් කරන විට, 2009 ජුනි 18 වැනිදා ඔහු අනාවරණය කළේ සිය පාර්ලිමේන්තුවේ කැළඹීම නොවේද?

මේ මොහොත වන විට මධ්‍යම ඉන්දියාවේ, මාඕවාදී ගරිල්ලා හමුදාව සමන්විතව තිබෙන්නේ නිදන්ගත කුසගින්න ජීවන කොන්දේසියක් වූ ද, උප සහරා අප්‍රිකාවට නෑකම් කියන සාගතයේ මායිමේ වාසය කරන අපේක්ෂා භංග වූ දිළිඳු ගෝත්‍රික ජන

සමූහයාගෙන්ය. මොවුන්, ඉන්දියාව ඊනියා නිදහස ලැබීමෙන් වසර 60 කට වැඩි කාලයක් ඉක්ම ගියද, අධ්‍යාපන අවස්ථා, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව, නෛතික සහන සැලසීම වෙත අවතීර්ණ වීම අහිමි කරන ලද ජන කොට්ඨාශයකි. නිර්දය සූරා කෑමට ලක් වූද, සුළු ව්‍යාපාරිකයින් හා මුදල් පොලී කරුවන් නිරන්තර වංචාවෙන් රවටන්නා වූද, වරප්‍රසාද කටයුත්තකදී පොලිසිය හා වන දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් එහි කාන්තාවන්ට බලහත්කාරකම් හා දූෂණ වලට ලක්වන්නාවූද, ජන කොට්ඨාශයකි. අභිමානය හා ගෞරවයේ සාම්‍යය වෙත ආපසු පියවර මනින චාරිකාව නියමිතව ඇත්තේ දැවැන්ත පාර්ශවයක් වන මාඕවාදී කාඩර්වරුන් වෙතයි; මන්ද දශක ගණනාවක් පුරා ඔවුහු මේ පීඩිත ජනතාව සමග ජීවත්වේ; වැඩ කටයුතුවල නිරතව සිටී, ඔවුන්ගේ පැත්ත ගෙන සටන් කරමින් සිටී.

එපමණක්ද නොව, මධ්‍යම සංචිත පොලිස් හමුදාව (CRPF), මායිම් අරක්ෂක හමුදාව (BCF), සහ අපකීර්තිමත් නාගා බල සේනාංකය මෙම අති දුෂ්කර ග්‍රාමීය වනාශ්‍රිත ගම්මානවල දැනටමත් ඉමහත් ව්‍යසනයක් ඇති කර තිබේ, එමෙන්ම අසාධාරණ, අයුක්ති සහගත සැහැසිකම් සිදුකර ඇත. එතෙකින් නොනැවතුණු ඉන්දීය ආණ්ඩුව සල්වා ජුදුම් (Salawa Judum), ''ජනතාවගේ හමුදාව'' (People's militia) ලෙස හඳුන්වන මැරවර කණ්ඩායමට ආයුධ සපයමින් උපකාර කරයි; මේ මැරවර පිරිස දන්තැවාද (Dantewada) වනය හරහා වැටී ඇති මාර්ගයේ ගමන් ගත් තුන් ලක්ෂයකට අධික නිවාස අහිමි හා පළා යන ජනතාවක් මරා දමා හෝ දූෂණය කර හෝ පුළුස්සා දමා තිබේ. දැන් රජය කටයුතු කරමින් සිටින්නේ ඉන්දු-ටිබෙට් මායිම් පොලිසිය සහ දස දහස් ගණනකින් සැදුම් ලත් පැරා මිලිටරි හමුදා එහි රැස් කිරීමටයි. බිලාස්පූර්වල (Bilaspur) (ගම්මාන නවයක් ඉවත් කරමින්) බල ඇණි 3 කින් යුත් සේනාංක මූලස්ථානයක් සහ රාජ්නන්ගාඕන් (Rajnandgaon) වල (ගම්මාන 7 ක් ඉවත් කරමින්) ගුවන් තොටුපලක් ඉදි කිරීම සඳහා රජය සැලසුම් කරයි. පැහැදිලිවම මෙම තීරණයන් ගෙන ඇත්තේ ස්වල්ප දිනකට පෙරය. යුද්ධය ඉතා ආසන්නයට පැමිණ ඇත. ඉන්දීය ගුවන් හමුදා හෙලිකොප්ටර් යානා වලට, ''ආත්මාරක්ෂාව'' යටතේ වෙඩි තැබීමේ අයිතිය පවරා තිබේ, නමුත් දිළිඳුම ජනතාවට ආත්මාරක්ෂාව අහිමි කරමින් සිටී.

''හරිත දඩයම් මෙහෙයුම'' (Operation Green Hunt) කුමන වර්ගයේ යුද්ධයක්ද? ඒ පිළිබඳ වනාන්තර වලින් තොරතුරු ගලා නොඑයි. බටහිර බෙංගාලයේ ලාල්ගාර්හ් (Lalgarh) ගම්මානයට ඇතුල්වීම පිටවීම වළක්වන මුර වළල්ලකින් වට කර තිබේ. ගමට ඇතුල් වීමට උත්සාහ කරන්නන්ට ගුටි බැට ප්‍රහාර ද, අත් අඩංගුවට ගැනීමටද කටයුතු යොදා ඇත. මෙම තහනම ඇත්ත වශයෙන්ම මාඕවාදීන්ටය; දන්තවාදාවල (Dantewada), හිමන්ෂු කුමාර් (Himanshu Kumar) විසින් මෙහෙයවන වනවාසී චේතනා ආශ්‍රමය හා ගාන්ධියන් ආශ්‍රමය පැය කීපයක් තුළදී බුල්ඩෝසර් යොදා බිමට සමතලා කරන ලදි. යුද්ධය ඇරඹීමට පෙර මාධ්‍යවේදීන්, සමාජ ක්‍රියාධරයින්, ගවේෂකයින්, සමීක්ෂකයින්, තොරතුරු වාර්ථාකරුවන් රැඳී සිට කටයුතු කළ මධ්‍යස්ථ, අපක්ෂපාතී, ලැගුම්හල් විය. මෙම ආශ්‍රම අද නැත.

''ලාංකීය දෙමළ ජාතික අරගල සමූලඝාතනය කළ විසඳුම'' හොඳින්ම සිදු විය හැකිව තිබේ. කොටි සංවිධානයට එරෙහිව ශ්‍රී ලංකාව ගෙන ගිය ප්‍රහාරාත්මක යුද්ධයේදී සිදුවූ යුධ අපරාධ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ මැදිහත් වීම වලකාලීමට ඉන්දියානු රජය කටයුතු කළේ හේතුවක් නැතිව නොවේ.

පසුගිය සතියේදී රටපුරා සමාජ විමුක්ති කණ්ඩායම් දිල්ලි අගනුවර මෙම යුද්ධය නවතා ලීමට හා ඒ ප්‍රවාහය වෙනතකට හැරවීමට කළ යුත්තේ කුමක්දැයි සාකච්ඡා කිරීමට රැස්වීම් ගණනාවක් සංවිධානය කළේය.

''ත්‍රස්තවාදයට'' තෝතැන්නක් වූ ''බුද්ධිමය වාතාවරණයක්'' (intellectual climate) නිර්මාණය කිරීම සම්බන්ධයෙන් සමස්ත ඉන්දීය ස්වදේශ අමාත්‍යවරයා මෑතකදී ජනතාවට චෝදනා කළේය. එම චෝදනාවලින් ජනතාව බිය වැද්දීමට අදහස් කළේ නම්, ඔවුන්ගේ ඔද බිඳ දැමීමට අදහස් කළේ නම්, ඊට ප්‍රතිවිරෝධී බලපෑමක්ද ඇත. මෙහිදී ලිබරල් මතවාද වල සිට රැ ඩිකල් වාමාංශික බව නියෝජනය කරන කථිකයෝ වූහ. මෙලෙස අදහස් දැක්වූ කිසිවෙක් නොවේ තමන් මාඕවාදීන් ලෙස පෙනී සිටියේ, නමුත් රජය ත්‍රස්තවාදයට එරෙහි ජනතාවට නැගී සිටීමට අයිතියක් ඇත යන ප්‍රතිපත්තියට කිසිවෙක් විරුද්ධත්වයක් නොපෑවේය. මාඕවාදී ප්‍රචණ්ඩත්වය පිළිබඳ, ලුහුඬු විනිශ්චයන් ප්‍රකාශ කරන ''ජනතා අධිකරණ'' පිළිබඳව, ආයුධ සන්නද්ධ අරගල කෙරෙහි බැඳී තිබෙන අධිකාරිවාදය පිළිබඳ, යුධායුධ නැති ආන්තික මිනිසුන් පිළිබඳව බොහෝ දෙනා අපහසුතාවයට පත්ව සිටිති. ඔවුන් තම අසතුට ප්‍රකාශ කරන විට, සාමාන්‍ය ජනතාවට ඉන්දීය රාජ්‍ය උසාවි වෙත ළඟාවීමට නොහැකි නිසා ''ජනතා අධිකරණ'' පවත්වාගෙන යන බව ඔවුහු දකිති; එසේම සිය නිජබිම් වල පැතිර ඇති සන්නද්ධ අරගලය මුල්ම අරගලය නොවන බවත්, පැවැත්මේ අද්දරට තල්ලු වී ගිය ඉච්ඡාභංගත්වයට හා අසරණතාවයට පත් ජනතාවගේ අවසාන විකල්පය අරගලය බවත් ඔවුහු දනිති. කේවල සිදුවීම් වලින් ඇති සරල මරණ සංඛ්‍යාව උපුටා දැක්වීමේ අනතුර සහ යුද්ධ හා සමානත්වයක් දැනටමත් ඇරඹී ඇති බව දේශකයෝ හොඳින් දැන සිටියහ.

යුධ කලාපවලදී ලාල්ගා(ර්)හ්, ජා(ර්)ක්හාන්ඩ්, චටිස්ගාහ් සහ ඔරිස්සා වලින් පැමිණි ජනයා, පොලිස් මර්ධනය, අත් අඩංගුවට ගැනීම, කෲර වධ හිංසා පැමිණවීම, මරා දැමීම, වංචා දූෂණයන්, පතල් කොම්පැනි වල වැඩ කරන නිළධාරීන්ගෙන් ඍජුව ලැබෙන නියෝග යනාදි සාධක පිළිබඳව විස්තර කියන්නට වූහ. ඒකාබද්ධ අපේක්ෂාවන් වෙනුවෙන් මුළුමනින් කැපවී සිටින ආධාර ඒජන්සි විසින් අරමුදල් සපයන ලද සමහර රාජ්‍ය නොවන සංවිධාන විසින් රඟ දක්වන සැක සහිත, අනර්ථකාමී භූමිකා පිළිබඳවත් ජනයා පැහැදිලි කළෝය. නැවත නැවතත් ඔවුහු කියා සිටියේ ජා(ර්)ක්හාන්ඩ් සහ චටිස්ගාහ් වල ක්‍රියාධරයන්, ඒවගේම සාමාන්‍ය ජනයා, එමෙන්ම විරුද්ධ මත දරණ ඕනෑම කෙනෙක් මාඕවාදීන් ලෙස හංවඩු ගසා හිරභාරයට ගන්නා අන්දම පිළිබඳවයි. ආයුධ ගෙන මාඕවාදින් හා උරෙන් උර ගැටී සටන් කිරීම හැර වෙන කළ හැකි දෙයක් නොමැති බව ඔවුහු පැවසුවෝය. ''සංවර්ධන'' ව්‍යාපෘති විසින් අවතැන්කර ඇති මිලියන 50 කට අධික ජන කොටස නැවත පදිංචි කරවිය නොහැකි බව විවෘතව ප්‍රකාශ කළ රජයකට හදිසියේම ''විශේෂ ආර්ථික කලාප'' 300 ක කර්මාන්තකරුවනට ඉතා අනගි ඉඩම් හෙක්ටයාර 140,000 ක් ලබා දීමට හැකි වූයේ කෙසේද? යනුවෙන් ජනයා ප්‍රශ්න කළේය. එමෙන්ම ඉන්දියානු මුහුදු වෙරළ ධනවතුන්ට මූදු කෙම්බිම වුයේ කෙසේදැයි ප්‍රශ්න කළේය. ඉඩම් පවරා ගැනීමේ පනත යටතේ ''මහ ජන කටයුතු'' (Public Purpose) වල අර්ථ දැක්වීම සමාලෝචනය කිරීම ශ්‍රේෂ්ඨාධිකරණය ප්‍රතික්ෂේප කරන විටත්, ''මහජන කටයුතු'' නාමයෙන් රජය බලහත්කාරයෙන් ඉඩම් අත්පත් කරගෙන පෞද්ගලික සංස්ථාවලට ලබා දීම එය හොඳින් දන්නා විටදි පවා, ශ්‍රේෂ්ඨාධිකරණය අත්හදා බලමින් සිටින්නේ කුමන වර්ගයේ යුක්තියක් දැයි ඔවුහු විමසා සිටිති. ''රාජ්‍යය පවත්වාගෙන යා යුතුය'' යන නියෝගය

(The write of the state must run) ගැන ආණ්ඩුව පවසන විට, එම ස්ථානය ගැනීමට පොලීසිය ස්ථාන ගත කරන බව පෙනීමට තිබෙන්නේ මන්ද යයි ඔවුහු විමසා සිටියහ. පාසැල්, වෛද්‍ය සායන, නිවාස හෝ පිරිසිදු ජලය නැත, වන නිපයුම් වලට සාධාරණ මිලක් නැත, ඔවුන් හුදෙකලා කොට ඇත,පොලීසියේ බිය වැද්දීම් නිමක් නැත, ජන ජීවිතය ගෙන යා හැකි කිසිදු පහසු කමක් නොමැති තරම්ය. ඇයි ''රාජ්‍ය නියෝග'' කිසිදා යුක්තිය පසිඳා ලන්නේ නැත්තේ-ඔවුහු ප්‍රශ්න නැගූහ.

බටහිර බෙංගාලයේ සිට ජාක්හාන්ඩ්, ඔරිස්සාව, චටිස්ගාහ්, ආන්ද්‍රා ප්‍රදේශය හා මහාරාෂ්ට්‍රා හි අර්ධයක් හරහා විහිදෙන, දන්දකර්නියා නමින් වරක් ප්‍රකට මෙම වනාන්තරය මිලියන ගණනක්වන ඉන්දියානු ගෝත්‍රික ජනයා ගේ වාස භූමිය යි; නිවහනයි. මාධ්‍ය මෙය හඳුන්වා දී ඇත්තේ රතු කොරිඩෝව නොහොත් මාඕවාදී ආලින්දය (Maoist corridor) ලෙසයි. ඉතා නිවැරදිව දක්වතොත් එය MoUist corridor යි. වාසි ලබන සංස්ථා, සාපේක්ෂව නොදත් සමාගම් වල සිට දැවැන්ත පතල් කැනීම් කොම්පැනි සහ ලෝකයේ වානේ නිෂ්පාදකයෝ - ඒවා, මිට්ල්ස්(Mittals), ජයින්ඩාල්ස් (Jindals), ටාටා (Tata), එසර් (Essar), පෝස්කෝ (Posco), රියෝ ටින්ටෝ (Rio Tinto), බීඑච්පී බිලිටන් (BHP Billiton) සහ ඇත්ත වශයෙන්ම වේදාන්ත (Vedanta) දැඩිව පොරයක නියැලී සිටින්නේ මෙම ආදිවාසීන්ගේ නිජ භූමිය අත්පත්කර ගැනීමටයි.

සෑම කන්දක්ම, ගංගාවක්ම, මෙන්ම වන මැද පිහිටි එළිමහන්ඃ පරි කල්පනය කළ නොහැකි සාමාජීය පාරිසරික ඉංජිනේරු වැදගත්කමක් දරන මේවා පිළිබඳ රජය හා අපයෝජන සමාගම් අතර අවබෝධතා ගිවිසුමක් පවතී. ලෝකයේ අති පුරාණ නොකිලිටි, වනාන්තර හා පරිසර පද්ධතියන්, එමෙන් ඒවායේ ජීවත්වෙන මනුෂ්‍යයින් විනාශ කිරීමට යොදා ඇති සැලසුම් කෝපන්හේගන් වල පවතින දේශගුණික විපර්යාස සමුළුවේදී සාකච්ඡාවට ගනීද යන්න මම නොදනිමි.

දිනාගැනීමට ලොවක් ඇත ප්‍රවෘත්ති සේවය (A World to Win News Service){aworldtowin.org}; ලෝකයේ මාක්ස්-ලෙනින්-මාඕවාදී පක්ෂ සහ සංවිධානවල කළලමය මධ්‍යස්ථානය වන විප්ලවීය ජාත්‍යන්තරවාදී ව්‍යාපාරයේ අනුග්‍රහයෙන් සිදු කරන ලද දේශපාලනික සහ න්‍යායික විමර්ශනය වන දිනාගැනීමට ලොවක් ඇත සඟරාව (A World to Win Magazine) විසින් ඉදිරිපත් කරන ලදි.

පරිවර්තනය
නව මාක්ස්වාදී අධ්‍යයන කණ්ඩායම
අංක 10
(T -10)